# සමෝධාන

2011 වෙළුම 2



පෙළ ගැස්ම


- ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ගේ ආගමික සංකල්ප සංවර්ධනය කිරීමෙහිලා ගුරුවරයාගේ කාර්යභාරය
- පෙර පාසල් වියේ දරුවා හඳුනා ගනිමු
- ප්‍රාථමික අංශ ගුරුතුමියයි මා ...
- පිපෙන්නට පෙර දරන මල් කැකුළු පුබුදුවමු
- ක්‍රියාකාරී අධ්‍යාපනයට මංපෙත් හෙළි කරන ක්‍රීඩාව
- අනාගත දරු පරපුර යහපත්වීමට නම්.....
- ගුරුන් පුදමු
- මුල් ළමාවිය සංවර්ධනය භාර ගුරුතුමියගේ යුතුකම් හා වගකීම්
- මතකයෙන් බිඳක්
- නිර්මාණාත්මක රචනයන් ලිවීමට අත්වැලක්
- උද්‍යානක අසිරිය



මුල් ළමාවිය සංවර්ධන හා
ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# සංස්කාරක සටහන

ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපනයේ මුල් පියවර වන්නේ ප්‍රාථමික අධ්‍යාපනයයි. මෙහි දී නිවස, ජීවත්වන පරිසරය සහ බාහිර ලෝකය ළමයින් සමග සම්බන්ධ කරනු ලැබේ. ප්‍රාථමික අධ්‍යාපනය මෙහි ප්‍රථම පියවර තැබීමට අවස්ථාව උදාකර දෙයි. නිවසේ භෞතික හා මානව පරිසරයට හා අවට පරිසරයට විචාරාත්මක ව වින්දනාත්මක ව නිර්මාණාත්මක ව දරුවා බද්ධ කිරීම, ප්‍රාථමික අධ්‍යාපන අවධියේ ගුරුවරුන්ගේ වගකීමයි. එහි එක් පියවරක් ලෙස, ජාතික අධ්‍යාපන ආයතනයේ මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, **"සමෝධාන"** පුවත් සඟරාව එළිදක්වනු ලැබේ.

මෙහි මූලික අරමුණ වන්නේ දරුවා ජීවත් වන භෞතික හා මානව පරිසරයට සහභාගී කිරීමකි. නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස හඳුන්වන සී.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නන්ගර මහතා අධ්‍යාපනය ලෙස හැඳින්වූයේ "අනාගත ජීවිතයට භෞතික වශයෙන් මෙන් ම ආධ්‍යාත්මික වශයෙන් ද සූදානම් කිරීමක් බවයි. ප්‍රාථමික අධ්‍යාපනයේ සිට මෙය ක්‍රියාත්මක කිරීමේ දී දරුවාගේ මානසික, කායික වර්ධනය හා මානසික විනය ඇති කිරීමටත් දරුවා වැඩ ලෝකයට හුරු කර කාර්යක්ෂමතාවෙන් යුත් පුද්ගලයකු කිරීමටත් අවශ්‍ය මූලික කුසලතා හා ආකල්පමය ශක්තිය ලබා දෙන්නේ ප්‍රාථමික අධ්‍යාපනයෙනි. මේ නිසා අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ප්‍රාථමික අධ්‍යාපනයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි.

මේ අනුව ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළෙන ගුරුවරුන්ට යම් මෙහෙවරක් කිරීම සඳහා එළිදැක්වුණු **'සමෝධාන'** පුවත් සඟරාව අධ්‍යයනය කර එයින් ප්‍රයෝජන ලබා ගන්නා මෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඔබ ඇරයුම් කෙරේ.


**උපදේශනය**
මහාචාර්ය ඩබ්ලිව්. එම්. අබේරත්න බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

ආචාර්ය ගොඩ්වින් කොඩිතුවක්කු
සහකාර අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)

**අධ්‍යක්ෂණය**
කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර
අධ්‍යක්ෂ
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**ප්‍රධාන සංස්කාරක**
පූජ්‍ය උඩුගම සුදස්සි හිමි
ව්‍යාපෘති නිලධාරී

**සහාය සංස්කාරක**
අයි. ජී. එස්. ප්‍රේමතිලක
ව්‍යාපෘති නිලධාරී
එස්. උදයචන්ද්‍රන්
ව්‍යාපෘති නිලධාරී
ජේ. ඒ. නිර්මලා දමයන්ති ජයසිංහ
සහකාර ව්‍යාපෘති නිලධාරී

**චිත්‍ර**
ජේ. චමරි තපස්වරගේ

**පිටකවර සැකසුම**
ඊ. එල්. ඒ. කේ. ලියනගේ

**පරිගණක අක්ෂර සංයෝජනය**
මොනිකා විජේකෝන්

**ප්‍රකාශනය**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.

# ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ගේ ආගමික සංකල්ප සංවර්ධනය කිරීමෙහි ලා ගුරුවරයාගේ කාර්යභාරය

ප්‍රාථමික පාසල් අවධිය ළමා සංවර්ධනයේ ඉතාමත් තීරණාත්මක අවධියකි. අනාගතයේ දී සාර්ථක පුරවැසියකු වශයෙන් ක්‍රියා කිරීමට අවශ්‍ය නිපුණතා රාශියක් ගොඩනැගෙන්නේත් හැඩගැසෙන්නේත් මෙම කාල පරිච්ඡේදයේ දී ය. මේ සඳහා ළමයින්ගේ සංවර්ධනයට හිතකර එසේම ඒවාට අනුබල දෙන්නාවූ පරිසරයක් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. මෙහි දී ළමයින්ට තමා අවට පරිසරය සමග නිරන්තරයෙන් ගැටී අත්දැකීම් ලබා ගැනීමටත් ක්‍රියාකාරී ලෙස පරිසරය සමග සම්බන්ධ වීමටත් ප්‍රීතිය හා සතුට අත්විඳීමටත් තමා කරන වැඩ තුළින් සාර්ථකත්වය භුක්තිවිඳීමටත් දෙමාපියන් හා ගුරුවරුන්ගේ ආදරය හා පිළිගැනීම ලැබීමටත් ඉඩප්‍රස්තා සැලසිය යුතු ය. එවැනි අවස්ථා ළමයින්ගේ සංවර්ධනය උපරිම මට්ටමකින් වැඩි කිරීමට අනුබල දෙන්නක් වේ (මහාචාර්ය කාලෝ ෆොන්සේකා).

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය දකුණු ආසියාතික අනෙකුත් රටවල් සමඟ සසඳන විට ඉහළ සංවර්ධන මට්ටමක පවතින බව පිළිගත් කරුණකි. ජාතික අධ්‍යාපන කොමිෂන් සභා යෝජනා අනුව (2003) පුද්ගලයින්ට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු බව යෝජනා කර තිබේ.

ඒ අනුව අරමුණු අටක් මගින් පොදු නිපුණතා හතක් ඉටු කර ගැනීමේ අපේක්ෂාවෙන් රජයේ පාසල්වල ප්‍රාථමික ශ්‍රේණිවලට ප්‍රධාන අවධි තුනක් යටතේ මව්බස, ගණිතය, ආගම හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යන කොටස් හතරකින් යුතු සමෝධානිත විෂයමාලාව හඳුන්වා දී ඇත.(විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, පස්වන ශ්‍රේණිය පිටු v, vii, ix, x ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, 2009).

ප්‍රාථමික ශ්‍රේණි විෂයමාලාවේ ආගම විෂය ද ඇතුළත් වන අතර ඒ හා සම්බන්ධ ආගමට ආචාර ධර්මවලට ආදාළ නිපුණතාවක් ද ඉදිරිපත් කර තිබේ. (පුද්ගලයින්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහා ගැනීම හා ස්වීයකරණය (විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, පස්වන ශ්‍රේණිය පිටුව vii ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, 2009)

ගුණවත් භාවය හා ආකල්පවලට අදාළ වූ මෙම නිපුණතාවෙන් ශිෂ්‍යයා තුළ සදාචාර ධර්මවලට හා ආගමික වතාවත්වලට ද ආගමික පුද පූජා, සිරිත් විරිත් හා ගති පැවතුම් ආදියට ද අනුකූල වන සේ සදාචාර ධර්ම සංවර්ධනය කර ගැනීම මෙයින් අපේක්ෂා කෙරේ. සාක්ෂරතාව ලබා දී ද්විතියික අධ්‍යාපනය සඳහා සිසුන් සූදානම් කිරීම පමණක් ප්‍රාථමික පාසල් ගුරුවරයාගේ කාර්ය භාරය නොවන අතර ආගමට අදාළ නිපුණතා සංවර්ධනය කිරීම එයට අයත් කාර්තව්‍යයකි.

ශිෂ්‍යයා නිපුණයකු වීමට නම් ආගමික සංකල්ප මගින්, දැනුම, ආකල්ප, කුසලතා හා අන්තර්පුද්ගල හැකියා ඒකරාශි වී ගොඩනැගෙන ජීවිත පුරුදු කර ගත යුතු ය. ආගමික කටයුතුවලට සම්බන්ධ වීම, ජීවන පුරුද්දක් බවට පත් නො වී හුදෙක් සිරිතක් ලෙස ක්‍රියා කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු නො වේ. ශිෂ්‍යයා තුළ ආගමික හැදියාව හා ළැදියාව ජීවිත පුරුද්දක් බවට පත් කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම හා ඊට උචිත පරිසරය සකස් කිරීම කෙරෙහි ගුරුවරුන්ගේ අවධානය යොමු විය යුතු ය.

දරුවාගේ මුල් ම ගුරුවරයා (පුබ්බාචරිය) මව සහ පියා (මාතා පිතරො) බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. (අංනි, සබ්‍රහ්ම සුත්ත) පූර්ව ළමා වියේ දී පූර්වාචාරීන් වන දෙමාපියන්ගේ ඇසුරින් මූලික භාෂා කුසලතා හා ගුණධර්ම පිළිබඳ ව පූර්ව දැනුමකින් යුක්ත වේ. පූර්ව ළමා විය ඉක්ම වූ පසු බුලත් හුරුල්ලක් දෑතින් ගෙන පාසලට

පිවිස දෙගුරුන් පුදා ශිල්ප හදාරන්නට සූදානම් වන්නේ පූර්වාචාරීන්ගේ මග පෙන්වීමෙනි.

පාසල් විෂයමාලාවට ආගම විෂය ඇතුළත් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ දැනුම ලබා විභාගය සමත් වීම පමණක් නොවන බව සෑම ගුරුවරයකු ම දන්නා කරුණකි. ආගමික කරුණු පිළිබඳ ව දැනුම තිබූ පමණින් ආකල්ප සංවර්ධනයක් ඇති නො වේ. ආගම විෂය මගින් ආගමික සංකල්ප සාධනය පිණිස ශිෂ්‍යයා නිර්මාණාත්මක චින්තනය හා චරිත සංවර්ධනය කළ යුතු ය.

ගුරුවරයා සෑම අවස්ථාවක දී ම ආදර්ශවත් චරිතයකින් හෙබි අයකු වීම ඉතාම වැදගත් ය. චාම් ඇඳුම් පැළඳුම්වලින් සැරසී සිටිය හැකි නම් එය ඉතා යෝග්‍ය වේ. විශේෂයෙන් ගුරුවරයා මනා ඇවතුම් පැවතුම් හා යහපත් වචන භාවිත කරන්නකු විය යුතු ය. කුමක් හෙයින් ද ප්‍රාථමික ශ්‍රේණි ශිෂ්‍යයා සෑම විට ම අනුකරණයට හා අනුගමනයට ප්‍රියතාවක් දක්වන බැවිනි.

ආගමට හා ආචාර ධර්මවලට අදාළ නිපුණතා සංවර්ධනය පිණිස ක්‍රමෝපායයන් කෙරෙහි නිරන්තර අවධානය යොමු කිරීම කාර්ය සාධනය පිණිස මහෝපකාරී වේ. පන්ති කාමරය ආගමික සිතුවිලි මතු වන ආකාරයෙන් සකස් කර ගත යුතු ය. පන්ති කාමරයේ සුදුසු ස්ථානයක තබා ඇති බුදුපිළිම වහන්සේට ගුරුවරයා මල් වට්ටියක්, පහනක් පූජා කර දෑත නළලේ තබා වැඳීම සිසුන්ට ආදර්ශයකි. දෛනික ව සිදු වන මෙම කටයුතු සඳහා සියලු සිසුන් සම්බන්ධ කර ගැනීමට ගුරුවරයා උනන්දු විය යුතු ය.

මල් පූජා කර ශිෂ්‍යයා තුළ අනිත්‍ය දර්ශනය මතු කරන්නේ කෙසේ ද? පූජා කිරීමට පෙර ලස්සන මල් සිසුන්ට පෙන්විය යුතු ය. එහි ලස්සන සුන්දරත්වය මතු කර සවස් වරුවේ සහ පසු දින එම පූජා කළ මල් නැවත නිරීක්ෂණයට අවස්ථාව ලබා දිය යුතු ය. එහි වෙනස එනම් පරවූ බව සිසුන්ගෙන් ම මතු කර ගත හැකි ය. මල් පූජා කරන ගාථාවෙන් අනිත්‍ය දර්ශනය ඉදිරිපත් කෙරේ. එහෙත් අනිත්‍ය ගැන මරණය ගැන උගන්වන්නට නොයා යුතු ය. අනිත්‍ය දර්ශනය යම් දිනක ඉගෙනීමට මග සැලසෙන අතර ජීවිතයේ අනිත්‍ය දර්ශනය මල පරවීම මගින් ශිෂ්‍යයා යම් දිනක ඉගෙන ගනු ඇත.

බෝසත් චරිතය, සිද්ධාර්ථ චරිතය, ගෞතම බුද්ධ චරිතය සිසුන්ට ඉගෙනීමට ආදර්ශවත් චරිත වශයෙන් දැක්විය හැකි ය. සිදුහත් චරිතය උගන්වා නම් ගම් විස්තර ඇතුළත් දැනුම පමණක් විමසීම ප්‍රමාණවත් නො වේ. ආගමික සංකල්ප මගින් චරිත සංවර්ධනය පිණිස කුඩා සිදුහත් කුමාරයාගේ චරිතය ආදර්ශයට ගන්නට මග පෙන්වීම ප්‍රයෝජනවත් ය. වප් මගුල් උත්සව අවස්ථාවේ සිදුහත් කුමරු භාවනා කිරීම පිළිබඳ අගය කළ යුතු ය. භාවනාව කුඩා ළමයින් ද සිදු කරන බව ඉගෙන ගන්නට අවස්ථාව ලබා දිය හැකි ය. කුඩා ළමයින් භාවනා කරන අවස්ථා පින්තූර හෝ වීඩියෝ දර්ශන මගින් පෙන්විය හැකි ය. භාවනාවෙන් ලැබෙන ප්‍රයෝජන කිහිපයක් සඳහන් කර ඒවා ළඟා කර ගන්නට භාවනාව සඳහා දෛනික ව විනාඩි පහක් හයක් යොමු කළ හැකි ය. එය සිසුන් වඩාත් ප්‍රිය ආකාරයකට කිරීම සඳහා ගුරුවරයා නිර්මාණශීලී විය යුතු ය.

ජාතක කතා මගින් බෝසත් සිරිත ඉගෙනීමට ශිෂ්‍යයාට අවස්ථාව ලබා දීම සුදුසු ය. දෙමාපියන්ට, ගුරුවරුන්ට හා වැඩිහිටියන්ට කීකරු වීම බෝසත් දරුවකුගේ ලක්ෂණ බව සාම ජාතකය වැනි ජාතක කතා මගින් ශිෂ්‍යයාගෙන් ම මතු කර ගත හැකි ය. දෙමාපියන්ට කීකරු ව කටයුතු කරන දරුවාට ලැබෙන ශක්තිය පිළිබඳ ව එම ජාතක කතාවෙන් මතු කර ගැනීම, ශිෂ්‍යයාට ප්‍රබෝධයක් වනු ඇත.

ශිෂ්‍යයාගේ ධනාත්මක සිතුවිලි මගින් පෞරුෂය වර්ධනය කිරීම පහසු වේ. ඒ අනුව සත්පුරුෂයන් ඇසුරු කිරීම (පණ්ඩිතානං ච සේවනා) වැනි ආගමික සංකල්ප මතු කර ගැනීමට අදාළ සරල කතා පුවත් කියා දීම වඩාත් සුදුසු ය. අසත්පුරුෂයන්ගේ ඇති ලක්ෂණ (අසේවනා ච බාලානං) දැඩි ව මතු කරන්නට නොගොස් යහපත් ඇසුරෙහි ඇති ධනාත්මක ප්‍රබෝධය කෙරෙහි සිසුන් යොමු කිරීම වඩාත් යෝග්‍ය වේ.

මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා වැනි සංකල්ප සිසුන් වෙත ගෙන යාමට නම් ආදර්ශයෙන් ම ඒවා ලබා දිය යුතු ය. සිසුන්ගේ උපන් දිනය වැනි අවස්ථාවක දී ඒ නිමිත්තෙන් අසරණ අයකුට ඇඳුමක් හෝ ආහාර වේලක් ලබා දීමට කටයුතු කළ හැකි ය. එමෙන් ම වැඩිහිටියකු හෝ අසරණ අයකු ගෙන්වා දෙමාපියන් ලවා නාවා, කවා, පොවා සංග්‍රහ කරන අවස්ථාවක් දැක බලා ගන්නට අවස්ථාව ලබා දීම සුදුසු ය. පන්තියේ ශිෂ්‍යයකු අසනීප වූ අවස්ථාවක සහයෝගය ලබා දීම, උදව් කිරීම වැනි කටයුතු දෙමාපිය සහාය ඇති ව සංවිධානය කළ හැකි ය. ඒ තුළින් සිසුන්ට බොහෝ දේ ආදර්ශයෙන් ම දැක බලා ඉගෙනීමට අවස්ථාව උදා වේ.

පොහොය වෙනුවෙන් මාසික ව සිදු කෙරෙන ආගමික වැඩසටහන් සංවිධානය කර ආගමික වතාවත්වල නියැළෙන්නට සිසුන්ට අවස්ථාව ලබා දිය හැකි ය. මෙහි දී සියලු ආගමික වතාවත් ඉටු කිරීමේ දී මූලිකත්වය සිසුන්ට ම ලබා දීමෙන් ප්‍රායෝගික ව ඉගෙනීමට අවස්ථාව ලැබේ. බොහෝ කුඩා සිසුන් මෙවැනි කටයුතුවලට දක්වන්නේ දැඩි උනන්දුවක් සහ කැමැත්තකි. එයින් උපරිම ප්‍රයෝජන ගැනීමට ගුරුවරයා සමත් විය යුතු ය. මෙම වැඩසටහන්වල දී ධර්ම දේශනා, භාවනා සහ දානමය කටයුතු සංවිධානය කළ යුතු අතර වැඩි වශයෙන් කුඩා සාමණේර ස්වාමීන් වහන්සේ ලා මෙම අවස්ථාවන්ට වැඩම කරවීමට හැකියාව තිබේ නම් එයින් ද විපුල ඵලප්‍රයෝජන ලබා ගැනීමට හැකියාව තිබේ. ආගමික වශයෙන් අප භාවිත කරන වචන යෙදීමට අවස්ථාව ලබා දිය යුතු අතර දරුවන්ට ඇසෙන සේ ආගමික වචන කතා කිරීමට ගුරුවරයා උනන්දු විය යුතු ය. එමෙන් ම කුඩා සිසුන්ට කුඩා සාමණේර හිමිවරුන් සමග කතා බහ කිරීමට අවස්ථාව උදා කර දෙන්නේ නම් වඩාත් යෝග්‍ය වේ.

ප්‍රාථමික අංශයේ සිසුන් තම දෙමාපියන්ට වඩා විශ්වාසයක් සහ බැඳීමක් තම ගුරුවරයා සමග ඇති කර ගනී. ගුරුවරයාට ආගම, ජාතිය, කුල හෝ දුප්පත් පොහොසත් භේදයක් නොමැත. මවක් තම එක ම දරුවාට (මාතා යථා නියං පුත්තං) ආදරය කරන්නාක් මෙන් ගුරුවරයා සියලු ශිෂ්‍ය ප්‍රජාවට මවක හෝ පියකු වන්නේ නම් එය කෙතරම් භාග්‍යයක් ද?

කිසි ම ශිෂ්‍යයකුට අසාධාරණයක් නොවන සේ පන්ති කාමරය සකස් කර ගන්නට බුද්ධ චරිතයෙන් ආදර්ශ ගත හැකි ය. බුදුරජාණන් වහන්සේ රාහුල කුමරාටත් අසරණ සෝපාකටත් දැක්වූයේ එක ම ආකල්පයකි. ගුරුවරයා ප්‍රථමයෙන් එම ආදර්ශය තුළින් පෝෂණය විය යුතු ය. අහිංසක ලා අංගුලිමාල ලා කිරීමේ හැකියාව ද ගුරුවරුන්ට ඇති අතර අංගුලිමාල ලා රහතන් වහන්සේ ලා බවට පත් කරන්නට ද ගුරුවරුන්ට හැකියාව තිබෙන බව බුදු දහමෙන් ආදර්ශ සපයයි.

ප්‍රාථමික අංශ ගුරුවරයා සිසුවකු වරදක් කළ විට කිසිසේත් දඬුවම් නොකළ යුතු ය. බුදුදහම දඬුවම ප්‍රතික්ෂේප කරන්නේ සියලු දෙනා දඬුවමට බිය වන බැවිනි. (සබ්බේ තසන්ති දණ්ඩස්ස (ධම්මපද දණ්ඩ වග්ග) බුදුරජාණන් වහන්සේ බොරු කියන පුද්ගලයා ගේ හිස් බව රාහුල පොඩි හාමුදුරුවන්ට ඉතා ම සරල පාඩමකින් ඉගැන්වූ ආකාරය අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙන් පැහැදිලි වේ. එවැනි සූත්‍ර ත්‍රිපිටකයෙන් හදාරා ආදර්ශ ගැනීමට ප්‍රථමයෙන් ගුරුවරයා උනන්දු විය යුතු ය. එවැනි ක්‍රම අනුගමනය කර වැරදි පෙන්වා දීම මගින් යහපත් ආකල්ප ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීමට කටයුතු කිරීම වඩාත් සුදුසු ය.

Torrance (1962) ඉදිරිපත් කරන පරිදි සිසුන් තුළ නිර්මාණාත්මක නවෝත්පාදන කුසලතා සංවර්ධනය පිණිස ගුරුවරයා අමුතු සොයා ගැනීම් සඳහා ඇලුම් කරන (නිර්භීත ගති ඇති) අයකු විය යුතු ය. එවන් ගුරුවරු ශිෂ්‍යයාගේ නව අදහස් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් සොයා දෙති. (එස්.කේ.නෙත්තානන්ද, අධ්‍යාපන නවෝත්පාදන 2003) අප පන්ති කාමරයේ දී ද චුල්ලපන්ථක වැනි ශිෂ්‍යයන් ගුරුවරයාට හමු විය හැකි ය. එහි දී ද ආගමික සංකල්ප උගන්වමින් ඉගෙනීමට ඉගෙනීම සඳහා ශිෂ්‍යයාට අවස්ථාව උදා කර දීම ගුරුවරයා සතු කාර්ය භාරය වේ.

නූතන අධ්‍යාපන විද්‍යාවේ උගන්වනු ලබන අධ්‍යාපන සංකල්ප බුදු දහමෙහි ද ඇතුළත් වේ.

(ඇකිරියගල නන්ද හිමි, බෞද්ධ දර්ශන අධ්‍යයනය 2010)

සුනාථ - අසන්න (දැනුම)
ධාරේථ - දරන්න (ආකල්ප)
චරාථ - හැසිරෙන්න (කුසලතා) යනුවෙනි.
එමෙන් ම තවත් අවස්ථාවක
සුතමය ඥානය - දැනුම (Cognltion)
චින්තනමය ඥානය - ආකල්ප (Attitudes)
භාවමය ඥානය - භාවිතය(Psychomotor)

මේ අනුව ශිෂ්‍යයා ඉගෙනීමෙන් ලබා ගත් දැනුමෙන් ආකල්ප සංවර්ධනයක් ඇති කරගෙන සරල දැහැමි ගුණ නැණ දෙකෙන් පිරුණු මනා පෞරුෂයකින් හෙබි ජීවිතයක් ගත කිරීමට සමත් වීම ජාතික පොදු අරමුණු මගින් අපේක්ෂා කෙරේ. එම තත්ත්වයට ළඟා වීම සඳහා ගුරුවරයා මාර්ගෝපදේශකයකු විය යුතු ය.

බොහෝ දේ ඉගෙන විෂය ඥානය ලබා ගත්ත ද ආගමික සංකල්පවලින් චරිත සංවර්ධනයක් නොලැබූ ශිෂ්‍යයාගෙන් තමාටත් සමාජයටත් යහපතක් නොවන බව ශිෂ්‍යයාට ඒත්තු ගැන්වීමට කටයුතු කිරීම සුදුසු ය. ඇතැම් ආගමික සංකල්ප ගැඹුරු වුව ද ත්‍රිපිටකය ආශ්‍රය කර ලබා ගත් කුඩා සරල කතා පුවත් මගින් ඉගෙනීමට අවස්ථාව සලසා දීම නිර්මාණශීලී ගුරුවරයාගේ කාර්ය භාරය වේ. උදාහරණ වශයෙන් පුංචි සිදුහත් කුමාරයා ඉපදී, ඔහුට දින හතක් ගත වෙද්දී ඔහුගේ මව (මහමායා දේවිය) මිය ගිය අතර ඔහුට රැකවරණය ලැබුණේ සුළුමවගෙනි (මහා ප්‍රජාපතී ගෝතමිය)

එහෙත් ඔහුට අවුරුදු දහසයේ දී සියලු ශිල්පයන් ඉගෙන ගෙන ජීවිතය ජය ගන්නට හැකි වූ ආකාරය කතා පුවත් මගින් කියා දිය හැකි ය.

එමෙන් ම පාසල යනු සෑම අංශයකින් ම ශිෂ්‍යයා සමාජානුයෝගී පුද්ගලයකු බවට පත් කරන්නාවූ ද, පූර්ණ පෞරුෂයකින් හෙබි ශිෂ්‍යයකු බිහි කරන්නා වූ ද, විධිමත් අධ්‍යාපනය ලබා දෙන සමාජීය ආයතනයක් වන බැවින් එය සමාජ සංවිධානයකි (අධ්‍යාපන මූලධර්ම කොළඹ විශ්වවිද්‍යාලය). එමෙන් ම පාසල සිසුන්ගේ නිවෙස් සමගත් ඉන් බැහැර පන්සල පල්ලිය හා කෝවිල වැනි ආගමික ආයතන සමගත් බැඳී පැවතිය යුතු ය ( ඒ. ඒ. නවරත්න, පාසල් පාදක ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ තක්සේරුව 1996).

එහෙත් වර්තමානය වන විට ජාතික පොදු අරමුණු සහ නිපුණතා පසෙක තබා පහේ දරුවන් ශිෂ්‍යත්වය වැනි තරගකාරී විභාග සඳහා සූදානම් කිරීමේ අභියෝගයට මුහුණ දීමට ගුරුවරයාට සිදු වී තිබේ. විශේෂයෙන් ආයතනවල ද විදුහල්පතිවරු සහ දෙමාපියෝ ද ඊට බලපෑම් කරති. තරගයට වැටෙන විට ගුණධර්මවලට හා නිර්මාණශීලි චින්තනයට වඩා ආත්මාර්ථකාමිත්වයට ප්‍රමුඛත්වය ලැබේ. එබැවින් මෙම ප්‍රායෝගික ගැටලු ජය ගෙන ඕනෑම අභියෝගයක් හමුවේ නොසැලෙන මනා පෞරුෂයකින් හෙබි සරල ජීවිතයක් ගත කරන්නට අවශ්‍ය අවකාශය ශිෂ්‍යයා තුළ නිර්මාණය කිරීම ගුරුවරයා සතු වගකීමකි.

එවන් වගකීමක් දරන ගුරුවරයා දෛනික ව ඉගෙන ගන්නා ශිෂ්‍යයකු ද වේ. මෙහි දී ඉගෙනීම සිය විෂයයට සීමා නොවිය යුතු ය. විෂය කරුණු පිළිබඳ නිරන්තරයෙන් කරුණු හැදෑරීම බුදුරජාණන් වහන්සේ බොජ්ඣංග සූත්‍රයේ දී "ධම්මවිචය" යන්නෙන් අනුදැන වදාරා ඇත (අං.නි. 06 බොජ්ඣංග සුත්ත) විෂය පථයට පරිබාහිර ව සමාජය හා සිසුන් ඇතුළු සියලු මිනිසුන් සම්බන්ධ මනෝවිද්‍යාව පරිසර විද්‍යාව හා විනය ආදි සියලු අංශයන්ගෙන් ගුරුවරයා යාවත්කාලීන වීම යෝග්‍ය වේ. විවිධ විෂයයන් උගන්වන ගුරු අඹරේ ප්‍රාථමික ශ්‍රේණි ගුරුවරයා පූර්ණ චන්ද්‍රයා විය යුතු ය.

***ශාස්ත්‍රපති පූජ්‍ය කුකුරම්පොල ඥාණවිමල හිමි***
*ව්‍යාපෘති නිලධාරී*
*සිංහල දෙපාර්තමේන්තුව*
*ජාතික අධ්‍යාපන ආයතනය*

## පෙර පාසල් වියේ දරුවා හඳුනා ගනිමු

"බබා ඇතුළත් කරන්න ඕනෙ අකුරු උගන්වන පෙර පාසලකටයි. නැත්නම් දරුවන් මෝඩ වෙනවා. සෙල්ලම් කර කර ඉඳලා හරියන්නෙ නැහැ." යනුවෙන් දෙමාපියෝ නිතර ම මැසිවිලි නගති.

එහෙත් දෙමාපියන් "ළමයා යනු ළමයකු මිස කුඩා මිනිසකු නොවන බව" අවබෝධ කර ගත යුතුයි. දරුවාට ආවේණික දස්කම් රැසක්, දරුවා ඉපදෙන විට මිට මොළවගෙන රැගෙන එන බව නොදන්නෙහි ද? දරුවා කුස තුළ දී ම මේ ශක්තිය තම ශරීරයේ ඉන්ද්‍රියන් හරහා ඉගෙන ගනී. එබැවින් මෙසේ රැගෙන එන ශක්තිය විසුරුවා හැරීමට දරුවාට අවස්ථාවක් තිබිය යුතු වේ. මේ සඳහා හොඳ ම තෝතැන්න වනුයේ පරිසරයයි. පරිසරය දරුවාගේ ගුරුවරයායි. තම ඇසට පෙනෙන දේවල් මනසින් නිර්ණය කර ගැනීමෙන් දරුවෝ අත්දැකීම් රාශියක් ලබා ගනිති. නිදසුනක් ලෙස බහ තෝරණ වියේ පටන් ම "කපුටා" හඳුනා ගන්නා දරුවා, තම අත්දැකීම්වලින් වයසින් වැඩෙත් ම ඉගිලෙන ඇසට දකින සතුන් සියල්ල ම කුරුල්ලන් ලෙස අවබෝධ කර ගන්නේ එකී කුසලතාව ප්‍රගුණ කරමින් ය. දරුවා පෙර පාසලකට ඇතුළත් කිරීමේ මූලික අරමුණ වන්නේ විධිමත් අධ්‍යාපනයට පිවිසීමේ දී ලබා ගෙන සිටිය යුතු ප්‍රවේශ දක්ෂතා දරුවාට ලබා දීමයි. විශේෂයෙන් ම ළමා කාලයේ දී ඇති කළ යුතු දක්ෂතා සහ ආකල්පවලට ගැළපෙන දැනුම සෞන්දර්යාත්මක ව හා නිර්මාණාත්මක ව ලබා දිය හැකි වන්නේ පරිසරයෙනි. මේ නිසා ම පෙර පාසල් අධ්‍යාපනය තුළ පරිසරාත්මක විෂය ඉගැන්වීමට වැඩි ඉඩ කඩ සලසා ගත යුතු වේ. ආරම්භයේ දී ම පරිසරයෙන් ලැබෙන අත්දැකීම්වලින් මිනිස් මොළය උත්තේජනය වන බවත් ඒ ඇසුරින් මිනිසා තුළ ජීව සාරයක් සේ ශක්තිය ඇති වන බවත් මනෝ විද්‍යාඥයන් පෙන්වා දී ඇත. දරුවාට ද එය එසේමයි. දරුවා ද පරිසරයෙන් ඇති වන හැඟීම් අනුසාරයෙන් මනසේ සිදු වන ක්‍රියාකාරීත්වය වඩාත් වර්ධනය වේ. අවුරුදු 3 - 6 දක්වා වයස් කාල සීමාව දරුවකුගේ ක්‍රියාශීලි බවේ හොඳම කාලයයි. එබැවින් එම ක්‍රියාශීලි බව වැඩි කර ගැනීමට අවශ්‍ය ඉඩකඩ සහිත ක්‍රියාකාරකම්වලට දරුවා යොමු කරවීම, පෙර පාසලේ ද මුල් තැනක් ගත යුතු ය. මෙහි දී සිරුරේ රිද්මය හඳුනා ගෙන දෑත දෙපා ඇසුරින් පුරුදු පුහුණු කළ යුතු රිද්මයානුකූල ක්‍රීඩා සඳහා දරුවා යොමු කරවීම ඉතා අගනේ ය.

පෙර පාසලේ දී පන්ති කාමරයට, පොත පතට ඩෙක්ස් පුටුවලට කොටු කරමින් අකුරු ලියන්න දීමට පෙර දරුවාට අවශ්‍ය ඉගෙනුම් පරිසරය සකසා දීමෙන් පසු දරුවා තම ඉන්ද්‍රියන්ගෙන් ලබා ගත හැකි ශක්තිය හඳුනාගෙන ඊට ගැළපෙන ලෙස නිතැතින් ම සූදානම් වෙයි. දරුවාට රිසි ලෙස අතපය දිග හැර ගනිමින් සෙල්ලම් කිරීමට ක්‍රීඩා කිරීමට පෙර පාසලේ දී ඉඩ පහසුකම් සලසා දිය යුතුයි. දරුවා සෙල්ලම් කිරීමෙන් ලබන තෘප්තිය දරුවාගේ අනාගතය සරුසාර කරනු නියතයි. මන්ද යත් කුඩා කල පටන් ම දරුවා හිරකරගෙන පොත පතට යොමු කිරීමෙන් දරුවාගේ රුචිකත්වය හැඟීම් ආශාවන් යටපත් වේ. පසු ව ක්‍රමයෙන් වැඩෙන දරුවා පොත පතට දැක් වූ රුචිකත්වයක් දැක්වීමට ඇවැසි කාලයේ දී ඉන් මිදේ. තම පීඩනය මුදවා ගැනීමට වෙනත් දේවල්වලට යොමු වීමට හැකියාව ඇති වේ. කුඩා කල දරුවාට නිදහසේ ගත කිරීමට ඉඩ හසර ලබා දී දරුවා අත්දැකීම් තුළින් පෝෂණය කිරීමෙන් දරුවා බොහෝ දේ ඉගෙන ගනී. මෙලෙස අත්දැකීමෙන් බහුල වන දරුවා විධිමත් පාසලට පිවිසෙනුයේ හිස් කොළයක් ලෙසට නොවේ. දරුවන් වැලි අතගාමින් කෝම්පිට්ටු හදන දරුවන් ඇඟිලිවල සියුම් මාංශපේශි ක්‍රියා කරන අතර එය දරුවාගේ මනස සමග එක් ව බුද්ධිය ද වර්ධනය වෙයි. ගුරුවරිය ද නිතර ම දරුවන් සඳහා පිරිසිදු බඩු බාහිරාදිය භාවිත කළ යුතු වේ. දරුවන් සඳහා දෙමාපියන් තුළ ඇති බිය පහ වී යයි. දරුවා දරුවකු ලෙස අවබෝධ කර ගන්නා ගුරුවරිය දෙමාපියන්ට ද පෙරපාසල් වසරක් පසුවන දරුවාගේ මනසට ඔරොත්තු දෙන ලෙස පරිසරය සමග අවබෝධය පින්තූර පොත් පත් ආදිය පරිහරණය කිරීමෙන් දරුවා පෝෂණය වන අන්දම පැහැදිලි කර දීම ඉතා අගනේ ය.

මෙලෙස දරුවා හඳුනාගෙන කටයුතු කිරීමෙන් ගුරුවරියට මෙන් ම දෙමාපියන්ට ද දරුවාට යහපත් අනාගතයකට අඩිතාලම සකසා දිය හැකි වේ.

**එම්.ඩබ්ලිව්.දිශාන්ති කෞශල්‍යයා**
*2011/ECD/146*
*මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව*
*ජාතික අධ්‍යාපන ආයතනය*

## ප්‍රාථමික අංශ ගුරුතුමියයි මා ....

සඳු මිලිනවී සූරිය රැස් කිරණ ගලා
තව එක දිනක් මුළු ලෝකෙට ජනිත කලා
නැති මුත් තවම මව් පදවිය උරුම වෙලා
දුව පුත ඔබ සැවොම අද මා මවක කලා

සුරතල් බසින් මා අමතන මගෙ පුතුනී
මුදු සෙනෙහසින් මා සිඹිනා දියණියනී
"ආ" යනු "අ" යනු ඇසෙනා විට ඔබෙ හඬිනී
මා සැනසුනේ මුළු ලොව ජයගත් ලෙසිනී

හොඳ මිනිසකු ලෙසින් මේ ලොව වැජඹෙන්න
මට නැගිටින්න කෝ ඔබෙ අත මට දෙන්න
දැනුනා මගෙ පුතේ ඒ සිතිවිලි ගොන්න
අපි යමු ඉදිරියට මගෙ දෑතම මෙන්න

***වයි.ඒ.ඩී.ගර්ට් විජේරත්න***
*ගුරු උපදේශිකා*
*ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය*

## පිපෙන්නට වෙර දරන මල් කැකුළු පුබුදුවමු

ලෝකයේ ම ඇති වටිනා සම්පත් අතරින් එකකි පුංචි දරුවන්. ඔවුන්ගේ ලෝකය නිර්ව්‍යාජ ය, සියුමැලි ය, සුවඳවත් ය, අවිහිංසකය. එසේ නම් මේ සියුමැලි ලෝකය සුවඳවත් කරන්නට, අතහිත දෙන්නට ගුරුවරියක. වීමත්, එක්තරා දුරකට, ලැබූ භාග්‍යයක් වනවා නොඅනුමාන ය.

පිපෙන්නට වෙර දරන මල් කැකුළු වන් දරුවන්ගේ ගත සිත සැනසීම, ඔවුන්ගේ ලෝකය සමඟ බැඳීම, යහපත් ආකල්ප ගුණධර්මයන්වලින් පිරිපුන් සදාචාර සම්පන්න මිනිසුන් පිරිසක් දැයට දායාද කරන්නට මුල් ළමාවිය මධ්‍යස්ථාන ගුරුවරියකට පැවරෙන විශාල කාර්ය භාරයක් හා වගකීමකි. සමාජයට දායාද කරන දරුවා කුමන තත්ත්වයේ සිටිය යුතු ද යන්න ගුරුවරියක විසින් අවබෝධ කර ගත යුතු කාලය එළැඹ ඇත. එසේ නම් බිහි වන්නේ රටට ජාතියට ආගමට හිතෛෂී පිරිපුන් දරුවන් පිරිසක් ද නැත හොත් සමාජයට අවැඩක්ම වූ දරුවන් ද යන්න තීරණය වන්නේ ඇය ලබා දෙන ආදර්ශයත් මග පෙන්වීමත් දැනුමත් මත ද යන්න විමසා බැලිය යුතු කරුණකි.

ගුරුවරිය යන්න වචනයට සීමා වුවක් නො වේ. ඇය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම, හෘද සාක්ෂියට එකඟ ව කටයුතු කරන අම්මා කෙනකු විය යුතු ය. එසේ නම් මේ පුංචි මල් කැකුළු තලා පෙලා විනාශයට පත් කරනවා ද? ලස්සන සුවඳවත් මලක් සේ පිපෙන්නට ඉඩ හරිනවා ද? යන්න තීරණය කරන්නේ ඇය වෘත්තිකයකු ලෙසත් පරිණත පුරවැසියකු ලෙසත් විපර්යකාරකයකු ලෙසත් වගකීම් සහ යුතුකම් නිසියාකාරක ව ඉටු කිරීම තුළිනි.

එසේ නම් මුල් ළමාවිය ගුරුවරියක සතු යුතුකම් සහ වගකීම් මෙසේ දැක්විය හැකි ය. එනම්,

යුතුකම් වනුයේ :
* දරුවකු තුළ සංවේදී බව ගොඩනැගීම
* හොඳ ආකල්ප ඇති කිරීම
* ආදරය කරුණාව දැක්වීම
* දෙමව්පියන් දැනුවත් කිරීම
* දරුවාගේ පවුල් පසුබිමේ ස්වභාවය හඳුනා ගැනීම

වගකීම් වනුයේ:
* දරුවා ආරක්ෂා කිරීම
* දරුවන්ට දැනුම ලබා දීම
* යහපත් දෑවලින් දරුවන් පෝෂණය කිරීම
* දරුවන් ඉදිරියේ පරමාදර්ශී ගුරුවරියක වීම
* ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්දක් හා දැනුවත් බවකින් යුතු වීම
* සංවිධානය කරන ක්‍රියාකාරකම් නිසි අයුරින් කළමනාකරණය කිරීම

* දරුවන් අතර සංවේදී බව ගොඩනැගීම
* පෙර පාසල නිත්‍යානුකූල ලෙස ලියාපදිංචි කිරීම

එසේ ම මුල් ළමාවිය ගුරුවරයකුට වෘත්තිකයකු ලෙස සතු යුතුකම් හා වගකීම් මෙසේ දැක්විය හැකි ය.

යුතුකම් වනුයේ:

* ක්ෂේත්‍රයට අදාළ ලෙස නව ඉගැන්වීම් ක්‍රම අධ්‍යයනය කිරීම (නව තාක්ෂණය)
* එක් එක් දරුවන්ට අනන්‍ය වූ ලක්ෂණ හඳුනා ගැනීම
* දරුවන්ට උපරිම ආදරය ලබා දීම හා සෞඛ්‍ය තත්ත්වය සොයා බැලීම
* දරුවන් ඇගයීමට ලක් කිරීම
* හෘදය සාක්ෂියට එකඟ ව සියලු කටයුතු කිරීම
* දරුවන් අධ්‍යයනය කිරීමෙන් දැනුම වර්ධනය කිරීම

වගකීම් වනුයේ:

* දරුවන්ට ගැළපෙන ලෙස සරල ආකාරයෙන් වයස් මට්ටම අනුව ඉගෙනුම් ක්‍රම භාවිත කිරීම
* මුල් ළමාවිය ක්ෂේත්‍රය පිළිබඳ ව වෘත්තීය දැනුමක් ලබා තිබීම
* ළමා ආරක්ෂණය පිළිබඳ අවබෝධයක් තිබීම
* දරුවන් සමාජානුයෝජනය කිරීම
* ස්ථිර, සාධාරණ, විනය ගරුක වීම

එසේ ම මුල් ළමාවිය ගුරුවරයකු විපර්යකාරකයකු ලෙස වගකීම් සහ යුතුකම් මෙලෙස දැක්විය හැකි ය.

යුතුකම් වනුයේ:

* අයහපත් හා වැරදි වචන භාවිතයෙන් දරුවා නිවැරදි කිරීම
* අයහපත් සෞඛ්‍ය පුරුදු ඇති දරුවන්ට යහපත් සෞඛ්‍ය පුරුදු ඇති කිරීම
* ක්‍රමානුකූල බව හා පිළිවෙළ පිළිබඳ දරුවන් දැනුවත් කිරීම
* දරුවාගේ බුද්ධි වර්ධනය සඳහා ස්වාධීනත්වය ඇති කිරීම

වගකීම් වනුයේ:

* අවට පරිසරය පිරිසිදු කර ගැනීම
* ගුරු දෙගුරු සම්බන්ධතා ගොඩනගා ගැනීම
* ළමයාගේ අධ්‍යාපනය පිළිබඳ දෙමාපිය දුර්මත දුරු කිරීම
* ක්ෂේත්‍රයේ යහපත උදෙසා නවතාවකින් යුතු වෙනස්කම් කිරීම

මෙලෙස ගුරුවරයකු සතු යුතුකම් හා වගකීම් අතිවිශාල ය. එබැවින් දරුවන් තුළ මේවා ගොඩනැගීමෙන් සාර්ථක ගුරුවරයකු වී රටට දැයට යහපත් දක්ෂ දරුවන් දායාද කිරීමට දරන මෙහෙය වඩා ඵලදායී කර ගත හැකි ය.

එසේ නම් එය ලියා නිම කළ නොහැකි විශාල මෙහෙයක් මුල් ළමාවිය ගුරුවරයකු විසින් සිදු කරන බව මනා ව පසක් වේ. අද දින පුංචි දරුවකු අනාගතයේ දී කෙසේ ජීවත් වෙයි ද? කුමක් කරයි ද? ඒ සැම ප්‍රශ්නයකට ම මුල් ළමා ගුරුවරිය දෙන ආදර්ශය අති මහත් ය. යහපත් ආකල්පයන් ගති පැවතුම් දැනුම ඇය හැම විටක ම ලබා දීමෙන් තුළින් හෙට දරුවාගේ ජීවිතය පැහැදිලි වනු නොඅනුමාන ය.

පුංචි මල් කැකුළු ලස්සනින් සේ ම සුවඳින් පරිසරයට ලෝකයට සුවඳවත් කරනවා සේ පුංචි පුංචි දරුපැටවුන් යහපත් ආකල්පවලින් දැනුමෙන් කුසලතාවන් පරිසරයට සුවඳවත් කරන්නට හැකියාව ලැබෙන්නේ පළමු ව පා තබන මුල් ළමාවිය මධ්‍යස්ථානයේ ගුරුතුමිය තුළින් බව මනාව පසක් වන බව නොඅනුමාන ය. එසේ නම් ඇගේ මෙහෙවර ලියා නිම කළ නොහැකි ය. ලෝකයට යහපත් ආකල්ප දැකිය හැකි දරු පරපුරකගේ නෙත් පැදෙන්නේ ඇගේ ශක්තියෙන් ධෛර්යයෙන් නුවණින් නොවේ ද? එය එසේ ම බව සියලු දෙනාට ම දැනෙනවා ඇතැයි සිතීම සාධාරණයැයි හැඟේ.

**ෂර්මිලා ගුණසේකර**

*2011/ECD/158*

*මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව*

## ක්‍රියාකාරී අධ්‍යාපනයට මංපෙත් හෙළි කරන ක්‍රීඩාව

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාදාමයට ළමයා අනුගත කිරීමට යොදා ගත හැකි ප්‍රබල සාධකයක් වන්නේ ක්‍රීඩාවයි. ළමයාගේ මුල් අවධියේ දී ක්‍රීඩාව ආත්ම කේන්ද්‍රීය වේ. ළමයා වැඩෙත් ම ඔහුට ආධාර කිරීමට ගුරුවරයා සූදානම් ව සිටිය යුතු ය. ක්‍රීඩාව අතිශය ප්‍රීතිය ගෙන දෙයි. ජීවිතයේ මුල් ම අවධියේ දරුවාගේ බුද්ධිමය පෝෂණයට චිත්තවේගීය සමතුලිතතාවට සමාජයීය අවබෝධයට කායික ශක්තියට මුල් වන්නේ ක්‍රීඩාවයි. ක්‍රීඩාව විනෝදයකි. ක්‍රීඩාව විනෝදයක් කිරීම ගුරුවරයාගේ වගකීමයි.

පියාජේ, වැලන්ටයින්, සිම්ලන්ස්කි, බියුලර්, අයිසැක්, ගෙසෙල් ළමයාගේ ක්‍රීඩා අවධි පිළිබඳ අදහස් ප්‍රකාශ කර ඇත. උපන් මොහොතේ සිට Funtioíl Play) අවුරුදු 2 දී නිර්මාණාත්මක ක්‍රීඩාවන්හි ද (Creative Play) ½ දී සංකේත ක්‍රීඩාවන්හි ද (Symbolic Play) යෙදේ. අවුරුදු 6 දී නීතිරීති අනුව කරන ක්‍රීඩාවන්හි යෙදේ. ළමයාගේ ක්‍රීඩා වර්ධනය වයස් අනුව නො ව පියවරෙන් පියවරට සිදුවන්නක් වශයෙන් ගැනීම වඩා යෝග්‍ය යැයි පිළිගෙන ඇත.

මනෝචාලක අවධියේ දී (උත්පත්තියේ සිට අවුරුදු 2 දක්වා) දරුවා යෙදෙන්නේ ක්‍රියාකාරී ක්‍රීඩාවන්හි පමණි. ළදරුවා තුළ නිසගයෙන් ඇතිවන ක්‍රියාවන්හි ප්‍රතිඵල අනුව ලැබෙන වින්දනය නිසා නැවත නැවත එම ක්‍රියාවන්හි නිරත වේ. එල්ලා තිබෙන සෙල්ලම් බඩුවකට පයින් ගැසීමෙන් එහාට මෙහාට සෙලවෙන බව ඔහු ඉගෙන ගනියි. ප්‍රථමයෙන් ම ගැසීම පමණක් සිදු වේ. එය ක්‍රීඩාවක් නොවේ. ක්‍රීඩාවක් වශයෙන් එය ආරම්භ වන්නේ එම ක්‍රියාවන් මගින් ක්‍රියාකාරී ව ප්‍රීතියක් විඳිමෙනි. බුලර් මේ අවස්ථාව භාෂාවේ අත්තිවාරම වශයෙන් සලකයි.

ළදරුවාගේ ප්‍රථම ක්‍රීඩාව අත් සෙලවීම හා ශබ්ද නිෂ්පාදනය කිරීමයි. ඉන්පසු තමාගේ ශරීරයේ කොටස් වූ ඇඟිලි, නාසය, කන යනාදිය සමහරක් සෙල්ලම් බඩු, රෙදි වැනි දේවල් සමගත් සෙල්ලම් කරයි. නාන අවස්ථාවේ වතුර ගැසීමෙන් අමුතු ම වින්දනයක් ලබයි. තුන් වන මාසයේ දී යමක් සෙලවීමෙන් ඇති වන ශබ්දය නිසා ම එය සොලවයි. හතර වන මාසයේ ඔහු බිළිඳු හඬින් උච්චාරණය කරමින් සින්දුවක ස්වභාවයෙන් ශබ්ද කරමින් සතුටක් ලබයි. උස් හඬක් ඇති කර ඒ ශබ්දය අඩු කරමින් විනෝද වේ. වැඩිහිටියකුගේ හිසකෙස් අල්ලා අතිශය ප්‍රීතියක් විඳියි. පස්වන මාසයේ අතට අසුවන ඕනෑම දෙයක් ගැනීමට ආසා කරයි. නියම සමාජයීය ක්‍රීඩාවන්හි නිරත වේ.

හයවන මාසයේ දී සතියක් පමණ අලුතෙන් සොයා ගත් ශබ්ද ඇති කරයි. ඒ ආකාරයට අලුත් වචන කියයි. හයවන මාසයේ නොයෙක් භාණ්ඩ විසි කර ඉන් නැඟෙන ශබ්දයෙන් සතුටු වෙයි. හැන්දක් බිම දැමීම, සෙල්ලම් බඩු බිම දැමීම, අම්මා පැළඳ සිටින කණ්ණාඩිය විසි කිරීම ආදිය ඉන් කිහිපයක් වේ. හත්වන මාසයේ යමකට බොහෝ වාරයක් ගසයි. සෙල්ලම් පියානෝවකට වාර ගණනක් ම තට්ටු කරයි. කෝප්පය යමක ගසයි. නොයෙක් ශබ්ද කරයි. මෙලෙස නිදා නොසිටින අවස්ථාවන්හි අතිශය ක්‍රියාකාරී වේ. අටවන මාසයේ දී එක් භාණ්ඩයක් සමග සෙල්ලම් කරයි. අලුත් ශබ්ද අභ්‍යාස කරයි. අලුත් භාණ්ඩයක් ලැබුණොත් එය වනමින් සෙල්ලම් කරයි. ඉතා ක්‍රියාකාරී ලෙස යමක් විකයි. උදුරා ගනියි. චලනය කරයි. තල්ලු කරයි. කකුලෙන් ගසයි. උස්සයි. දසවන මාසයේ දී නොයෙක් දේ අත්හදා බලයි. අම්මා සමග ක්‍රීඩා කරයි. කටේ යමක් තබාගෙන නැගිටියි. බඩු විසි කරයි. එය ඇහිඳ ගනියි. වරින් වර මෙසේ විසි කරමින් ඇහිඳ ගනියි.

අවුරුද්දේ දී පමණ මනඃකල්පිත භාණ්ඩ සමග සෙල්ලම් කරයි. හැන්දක් ගෙන බෝනික්කකුට කිරි පොවයි. ඇවිදීම ආරම්භ වනවාත් සමග ම ගවේෂණය කිරීම වැඩි වෙයි. චලනය වැඩි වේ. මීට පෙර දර්ශන පථයට ඇතුළත් නොවූ දේ ගැන සොයයි. ග්‍රහණය කිරීමට නොහැකි වූ උසක ඇති දේ ගැනීමට උත්සාහ කරයි. නිර්මාණ හා සංකේත ක්‍රීඩාවට තුඩු දෙන 12 වන මාසයේ සිට 24 වන මාසය දක්වා,

මනඃකල්පිත තෑගි ලැබීමට අත දිගු කරයි.
පොතක පිටු පෙරළයි.

රූප දෙස බලා සිටියි.

ක්‍රීඩා කිරීමට ඇති ආශාව නිසා කෑම නොගනියි.

බංකු පුටු ආදියට නගියි.

බෝලය පොළවේ ගසයි.

18 සිට 30 වන මාසය දක්වා තමන්ගේ සෙල්ලම් බඩු වෙනත් ළමයින් ඇල්ලීම ගැන විරුද්ධ වේ. අණ කළ විට සෙල්ලම් බඩු අනිත් අය සමග බෙදා ගනියි.

19 වන මාසයේ දී මිනිත්තු 5ක් පමණ නොකඩවා ක්‍රීඩා කරයි. මනඃකල්පිත ක්‍රීඩා කිරීම ආරම්භ වේ.

20 වන මාසයේ දී කෝප්පයක් බිම දමමින් අනුකරණය කරයි. සැඟවූ දෙය සොයයි. බොරුවට නිදා සිටියි. බෝනික්කන්ට මනඃකල්පිත ආහාර කවයි. නිර්මාණාත්මක ක්‍රීඩා ආරම්භ වේ.

23 වන මාසයේ දී ගඩොල් පේළියකට තැබිය හැකි ය. ලී කෑලිවලින් යමක් තැනිය හැකි ය. රූප දෙස උවමනාවෙන් ටික වේලාවක් බලා සිටියි. පැන්සල ගෙන අඳියි.

29 වන මාසයේ දී අඳින ලද දෙයක් ඇඳීමට උත්සාහ කරයි. යාන්ත්‍රික සෙල්ලම් බඩු ගැන උනන්දුවක් දක්වයි. චිත්තවේග පළ කරමින් ක්‍රීඩා කරයි. (සිනාසෙයි. හඬයි) මනඃකල්පිත ක්‍රීඩා වැඩි වේ.

30 වන මාසයේ දී නාට්‍යකරණය උදාවෙයි. මනඃකල්පිත ආහාර බෝනික්කාට දෙයි. බෝනික්කන් නළවයි. සුරතන් සතුන් හා විනෝදය අර්ථ විරහිත ක්‍රීඩාවන්හි සමහර විට නිරත වේ. මේ අවධිය නිරීක්ෂණය, ගවේෂණය, ස්පර්ශ කිරීමට අවස්ථා සැලසීම මගින් ළමයාගේ බුද්ධි වර්ධනයට විශාල අනුබලයක් ලබා දිය හැකි ය.

ඉහත සඳහන් වන්නේ මට්ටම් අනුව ළමයින් තේරුම් ගෙන ඔවුන්ට ඒ ඒ අවධියේ දී උචිත ක්‍රීඩා කුමක් ද යන්න තීරණය කොට එම ක්‍රීඩාවන්හි ළමයින් නිරත කරවීමට ක්‍රියා කළ යුතු ය. නිර්මාණශීලි ව, සාරවත් ව සකස් කළ පරිසරයක දී ක්‍රියාකාරි ක්‍රීඩා අවස්ථා ඇති වේ.

***අයි.පී.එස්.ප්‍රේමතිලක***

*ව්‍යාපෘති නිලධාරි*

*මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව*

*ජාතික අධ්‍යාපන ආයතනය*

## අනාගත දරු පරපුර යහපත් වීමට නම්...

"බස් රථයේ අසුනක හිඳ සිටි මට පුංචි බේබි කොලොන් සුවඳක් දැනුණි. මම ඒ සුවඳ දිගේ දෑස් යොමු කෙරුවෙමි. අදහන්න ...පුංචි බට්ටි කෙල්ලක මා දැක සිනා සෙන්නී ය. ඇගේ තොල් පෙති ලා රතු ය. ඇගේ කම්මුල් ලා සඳය. ඇය අහිංසක ය. මේ අනාගත ජීවිත 'අ' යනු 'ආ' යනු ගළපන වත්මන් පුංචි දරු පරපුර නොවේ ද " මට සිතිනි.

පිපෙන්නට වෙර දරන පුංචි මල් කැකුළු වන් ලෝකය දෙස දෙනෙත් අයා බලා සිටින සිඟිති දරුවා, ටිකෙන් ටික වැඩී වර්ධනය වී, මව පියා අනුගමනය කරමින් සමාජය අනුකරණය කරමින් සියලු දේ ඉගෙනීමට සියලු දේ දැන ගැනීමට අලුත් දේ කරමින් තම දස්කම් පෙන්වීමට දුවන්නට පනින්නට කෙළි දෙලෙන් සිරීමට ඉතා ආශාවෙන් පෙළෙයි. බුද්ධි වර්ධනයත් ශරීරයේ හා ඉන්ද්‍රිය වර්ධනයත් සමග කුඩා කල සිට ම සියලු දේ කුතුහලයෙන් අත ගා බලමින් සොයා බලන්නට පෙලඹෙයි. එයින් නොනවතින දරුවා අලුත් දේ සොයා යාමට වෙර දරයි. එවන් දරුවාට ඔහුගේ එම ලෝකය සොයා යන්නට යන ගමනේ දී දිරියක් පන්නරයක් වෙමින් දරුවාට ලබා ගැනීමට ඉඩ සකසා දීම වැඩිහිටියන් සතු යුතුකමයි, වගකීමයි.

මව් ඇකයෙන් මොහොතකට මිදී දරුවා පෙර පාසල් අධ්‍යාපනය කරා එන ගමනේ දී තමා පැමිණෙන වටපිටාව අතිශය පීඩාකාරී සංකීර්ණ කිසි දිනක නො වූ විරූ කුටුම්බයක සිරවීමට හෝ කොටුවීමට යන බව දරුවාට නොහැගෙන නොදැනෙන තැනක් වන ලෙස වග බලා ගත යුතු අතිශය උත්තුංග පදවියක් උසුලන මුල් ළමාවිය

ගුරුවරිය හෙවත් පෙර පාසල් ගුරුවරිය කෙතරම් දයාව කරුණාව ආදරය හා ඉවසීම පිරි තැනැත්තියක විය යුතු ද යන්න අපට වැටහෙන කරුණකි.

ක්ෂේත්‍රය පිළිබඳ ව මනා හැදෑරීමක් කිරීමෙන් ලබන දැනුම න්‍යායාත්මක කරුණු කාරණා ප්‍රායෝගික ව අත්හදා බලමින් අත්දැකීම් ලබමින් මනා පළපුරුද්දක් ඇති කර ගැනීම විනා හතු පිපෙන්නා සේ බිහි වන **මොන්ටිසෝරි ටීචර්** යන නාමය දරමින් දරුවන් ඇතුළු මුළු මහත් සමාජය ම රවටමින් මුදල් හරි හම්බ කිරීමට පමණක් වෙර දරන පැවැත්මක් නැති කැළලක් ඇති කරගත් පුද්ගලයකු ලෙස වැජඹීම පෙර පාසල් ගුරුවරියක සතු භූමිකාව නොවෙයි. ක්ෂේත්‍රයට අදාළ දැනුම දිනෙන් දින යාවත්කාලීන කර ගනිමින් දරුවාගේ මනස හා ඔහුගේ කුසලතා මොට නොකිරීමෙන් නිර්මාණශීලී සංවේදී දරු පරපුරකට වස්තු බීජය දැමීමෙන් දරුවාගේ ශාරීරික මානසික සමාජීය හා බුද්ධිමය වශයෙන් දරුවා සංවර්ධනය කිරීම ගුරුවරියකගේ පරම යුතුකම ද වගකීම ද වේ. ඒ සඳහා වෘත්තීය පිළිබඳ ව පළපුරුද්දක් ඇති, වෘත්තීය ප්‍රවීණයන්ගෙන් උපදෙස් හා නව සංකල්ප පිළිබඳ ව දැනුම ලබා ගනිමින්, දරුවා ඉදිරියේ සදාචාර සම්පන්න අවංක විනයගරුක පරමාදර්ශී චරිතයක් ලෙස තම පෞරුෂය ගොඩනගා ගනිමින් තම කුසින් උපන් දරුවකු ලෙස සිතමින් ආදරය කරුණාව දයාව ආරක්ෂාව නිරතුරුව ම ලැබ දෙමින් දරුවා සංවර්ධනය කළ යුතු ය යන වගකීම හා යුතුකම දන්නේ නම් එවැනි මවක උත්තරීතර ගුරු පදවිය දැරීමට සමත් වන්නියක බව අවවාදයෙන් පිළිගත යුතු කරුණකි.

***කේ.එස්.අමා මන්දහාසි***

*2011/ECD/144*

*මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව*

## ගුරුන් පුදමු

ජන්ම ලාබය ලැබු ලක් මවගෙ දරුවන්ට
කටු කොහොල් බිඳ දමා දිවි මගේ ඉදිරියට
යන්ට මග කියා දුන් ගුරුමව්ට පියතුමට
ලබා ගත් පින් ඇති නිර්වානෙ දොරටුවට

සිය දරුවෝ පසෙක ලා දැයෙ දරුවෝ පෙරට ගත්
ජාතියේ ගෞරවය පුද කරමු සතුටු සිත්
නිරෝගි සැප ලබා දිඝායු වේ මහත්
මේ දෙරණේ ඉපදෙන්ට අපි පතමු යළි යළිත්

**ඩබ්ලිව්.එම්. රෝහිණී චිත්‍රලතා**

*ගුරු උපදේශිකා (ප්‍රාථමික අධ්‍යාපනය)*

*ගිරිඋල්ල අධ්‍යාපන කලාපය*

*අලව්ව අධ්‍යාපන කොට්ඨාසය*

## මුල් ළමාවිය සංවර්ධනය භාර ගුරුතුමියගේ යුතුකම් හා වගකීම්

මෙලොවට බිහිවන දරුවාගේ මුල් ම ගුරුවරුන් වන්නේ දෙමව්පියන් ය. හා හා පුරා කියා මව් ඇකයෙන් බසින දරුවා මුලින් ම පය තබන්නේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයටයි. වයස අවුරුදු 3ක් පමණ ගෙදර පරිසරයෙන් අත්දැකීම් ලබන දරුවා එයින් මිදී සමීප වන්නේ මුල් ළමාවිය ගුරුතුමියටයි. ගුරුතුමියට සමීප වන දරුවාගේ චිරචරිය මග පෙන්වන්නිය වන්නේ ඇයයි. අනාගතයේ සමාජ ගත වන දරුවාට ශක්තිමත් අඩිතාලමක් දැමිය හැක්කේ මුල් ළමාවිය ගුරුතුමියටයි. එබැවින් ඇයට පැවරී ඇති වගකීම හා යුතුකම අතිමහත් වේ. දරුවාගේ අනාගතය සුරක්ෂිත කිරීම මුල් ළමාවිය ගුරුතුමියගේ ප්‍රධාන යුතුකමයි.

නිතර ම තමාගේ දැනුම යාවත්කාලීන කරගනිමින් හොඳ අත්දැකීම් තුළින් පළපුරුද්ද වැඩි කර ගනිමින් තම කීර්ති නාමය ආරක්ෂා කර ගනිමින් තම සීමා ගැන දැනුවත් බවින් ක්ෂේත්‍රයේ හැසිරීම ඉතා වැදගත් වේ. ගුරුතුමිය නිරන්තරයෙන් ම දරුවන්ට ආදරය කරුණාව සමසේ දැක්විය යුතු අතර ම දරුවන් ඇගයීමෙන් නිර්මාණශීලී දරුවකු

බිහි වනු ඇත. ක්ෂේත්‍රයට අදාළ නව ඉගෙනුම් ක්‍රම අධ්‍යයනයෙන් දරුවාට උචිත දේ නියමාකාරයෙන් ඉගැන්වීම ගුරුවරිය සතු වගකීමක් මෙන් ම යුතුකමක් ද වේ. නිරන්තරයෙන් ම දරුවාට අකුරු ඉගැන්වීමට උත්සුක නො වී වෙනත් ක්‍රියාකාරකම් මගින් දරුවාට අකුරු ඉගැන්වීමට අවශ්‍ය මූලික අඩිතාලම සපයා දිය යුතු ය.

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ දී දරුවන්ට අත්වැඩ, නිර්මාණ ක්‍රියා, භාෂා වර්ධන ක්‍රියාකාරකම් හා සෞන්දර්ය ඉගැන්වීමෙන් සවන්දීම කථනය නිර්මාණශීලි බව හා ගණිත සංකල්ප වඩා හොඳින් දියුණු වූ දරුවකුට විධිමත් පාසලට යාමේ දී අකුරු ඉගෙනීම ඉතා පහසු කාර්යයක් වනු නොඅනුමානයි. මේ පිළිබඳ දෙමව්පියන් තුළ ඇති දුර්මත ඉවත් කර නිවැරදි දේ පහදා දීම මුල් ළමාවිය ගුරුතුමියගේ වගකීමකි. දරුවන්ගේ අසාමාන්‍ය හැසිරීම් ඇත්නම් ඊට හේතු දරුවා මගින් දැන ගැනීමට අපහසු නම් දෙමාපියන් සමග සාකච්ඡා කර විසඳුම් ලබා ගැනීමෙන් දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කළ හැකි ය.

දරුවා නිතර ම මුල් ළමාවිය ගුරුතුමිය අනුකරණයට පෙලඹීම සාමාන්‍ය සිද්ධියක් බැවින්, තමාගේ ඇවතුම් පැවතුම් (ඇඳුම් පැළඳුම්, කතාබහ, කෑම බීම, හැසිරීම) ගැන සුපරීක්ෂාකාරී වීම ගුරුතුමිය සතු යුතුකමකි. පෞද්ගලික දැන හැඳුනුම්කම් නොපෙන්වා සෑම දරුවකුට ම සාමානත්වයෙන් සැලකිය යුතු අතර යහපත් සෞඛ්‍ය පුරුදු යහපත් සිරිත් විරිත් හා සදාචාරාත්මක අගයයන් දරුවන්ගේ සිත් තුළ තැන්පත් කළ යුතු ය. මුල් ළමාවිය ගුරුතුමිය ආර්ථික වාසි සමාජ තත්ත්ව ලබා ගැනීම වෙනුවෙන් කිසිසේත් ම තම කීර්තිනාමයට හානි නොකර ගත යුතු ය. ගුරුතුමිය නිරන්තරයෙන් විනය ගරුක හා ස්ථිර හා සාධාරණ අයකු විය යුතු ය. සෑම ගුරුවරයකු ම තම යුතුකම හා වගකීම් මැනවින් වටහා ගෙන වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම ගුරු මවක් වන්නේ නම් හෙට ලොව භාර ගැනීමට සිටින මල් කැකුළු වන් දරුවන්ගේ ලෝකය සුරක්ෂිත වනවා මෙන් ම අපට ද ලස්සන අනාගතයක් හිමි වනවා නොඅනුමාන ය.

**දමයන්ති කුමාරි රත්නායක**
මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

# මතකයෙන් බිඳක්

එක්තරා පාසලක පළමුවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කුඩා දරුවකු පැන්සල කෑමට පුරුදු ව සිටියේ ය. ඔහුගේ එම පුරුද්ද ගැන දරුවාගේ මව නිතර දරුවාට අවවාද කළා ය. එහෙත් ඉන් ප්‍රතිඵලයක් නොලැබුණි. දරුවාගේ පැන්සල් හැපීමේ පුරුද්ද දිගට ම ක්‍රියාත්මක විය.

දිනක් පාසල ඇරී දරුවා ගෙදර පැමිණි පසු මව පැන්සල පරීක්ෂා කර බැලුවා ය. ඇයගේ ඉවසීමේ රතු ඉර පැන දරුවාට සැර දැමුවා ය.

“මොකක්ද මං උඹට හැමදාම කියනවා... අදවත් පැන්සල නොකා ගේන්න බැරි වුණා නේ ද? ... ”

කුඩා දරුවාට පැන්සල කෑමෙන් ලද ප්‍රීතිය මොහොතකට නැති වී බියෙන් ඇළලී ගියේ ය. හෙතෙම නිහඬ ව බිම බලාගෙන පොළොව පහුරු ගෑවේ ය.

“ආ ... අද උඹ මේ පැන්සල ඔක්කොම කාපන් ... ආයෙ මං මෙතෙන්ට එන්න කලින් උඹ මේ පැන්සල කන්න ඕනි... උඹට ඕනි පැන්සල් කන්නනේ ..”

මව දරුවාට කෝපයෙන් අණ කර ගෙතුළට ගියා ය. දරුවා ද ඉතා සුවච කීකරු ව තම මවගේ අණ අමාරුවෙන් වුවත් පිළිපැද්දේ ය. කෝපය නිසා දරුවාට බැණ වැදුණ ද හදිසියේ ම මවට දරුවා හා පැන්සල සිහි වී ඔහු සිටි තැනට දිව ආවා ය.

“කෝ පුතේ පැන්සල ..”
නිවී සැනහී සිටි මව සෙනෙහසින් යුතු ව පුතාගෙන් විමසුවා ය.

“මං... මං... ඒක හරිම අමාරුවෙන් කෑවා අම්මා... මේ බලන්න චුට්ටක්වත් ඉතිරි කළේ නෑ. අනේ සත්තයි අම්මා.... මට ගහන්න එපා”

දරුවාගේ මුවින් වදන් ගිළිහෙද්දී දෙනෙතින් කඳුළු ද වැගිරිණි.

"දෙවියනේ" යි මවගේ මුවින් ඉබේට ම නික්මිණි.

ඔබට මේ කතාව සම්බන්ධයෙන් කිව යුතු බොහෝ දේ ඇතැයි මම සිතමි. මට කිව හැක්කේ මෙපමණකි. කුඩා දරු පැටවුන්ට යමක් කියන්නට පෙර සිතා බලනු යනුවෙනි.

**ඩබ්ලිව්.කේ.ඩී.එස්.ප්‍රියදර්ශනී**

*බප/හෝ/උඩගම ක.වි.*

## නිර්මාණාත්මක රචනයක් ලිවීමට අත්වැලක්

සිසුන්ට නිර්මාණාත්මක ව රචනයක් ලිවීමට හුරු කරවීම ඉතා අපහසු කාර්යයක් බව පස්වන ශ්‍රේණිය භාර ව කටයුතු කරන ගුරු භවතුන්ගේ මැසිවිල්ලකි. මේ සඳහා යම් කිසි අත්වැලක් ලබා දීමට මා ලද මෙම අත්දැකීම රුකුලක් වනු ඇත.

ඇය නවක උපාධිධාරී ගුරු මහත්මියකි. පත්වීම් ලද පළමු වර්ෂයේ ම ඇයට පස්වන ශ්‍රේණිය භාර ගැනීමට සිදුවිය. ඉමහත් කැපවීමකින් එම ශ්‍රේණියෙහි සිසු දරුවන්ට ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු කළ එතුමියට මහත් හිසරදයක් වූ ගැටලුවක් මතු විය. එනම් එම දරුවන්ට නිර්මාණාත්මක රචනයක් ලිවීමට හුරු කර වීම ය. එම දරුවන් තුළ නිර්මාණාත්මක බව නොමැති කම නිසා මෙය අපහසු වන බව ඇයගේ මැසිවිල්ල විය.

මෙම තොරතුරු සමඟ එම ගුරු මහත්මිය සමඟ දිගින් දිගට ම කටයුතු කිරීමට මම එකඟ වූයෙමි. ඒ අනුව පළමු ව සිසුන්ට චතුර්විධ භාෂා පෝෂණය ලැබෙන විවිධ ක්‍රම සොයා බැලුවෙමි. එහි දී පෙනී ගිය කරුණක් වූයේ එම දරුවන්ට පාසල හැර භාෂා පෝෂණයට මෙවන් ක්‍රමයක් නොමැති බවයි. එනම් පාසලින් ලබන අත්දැකීම් මෙම දරුවන්ගේ ප්‍රධානම ඉගෙනුම් අත්දැකීම් වී ඇති බවයි.

එසේ නම් නිර්මාණාත්මක ව ලිවීම සඳහා මෙම දරුවන්ට උදව් ලබා දිය යුත්තේ කවුරුන් ද? යන ප්‍රශ්නයට පිළිතුරු සෙවීමට වෙහෙස වූයෙමි. එහි දී ලැබුණු පිළිතුර වූයේ ඒ සඳහා ඍජු ව ම ගුරු භවතා මැදිහත් විය යුතු බවයි.

එසේ නම් එය කළ හැක්කේ කෙසේ දැයි සිතන්නට මට සිදුවිය. ඒ අනුව එම ගුරු මහත්මියට එක් මග පෙන්වීමක් කර එය අත්හදා බැලීමට මට සිතුණි. ඒ නිසා ගුරු මහත්මිය සමඟ සාකච්ඡා කර පහත ආකාරයේ විසඳුමකට ළඟා වීමට හැකි විය. එනම් සතියකට නිර්මාණාත්මක රචනා දෙකක් ගුරුතුමිය විසින් නිර්මාණ පැදුරෙහි ප්‍රදර්ශනය කළ යුතු ය යන්නයි. එයට එකඟ වීමත් සමඟ එය මෙසේ සංවර්ධනය කර ගන්නා ලදී. සතියෙහි පළමු දිනයේ එනම් සඳුදා දිනයෙහි ගුරුතුමිය රචනයක් ලියා එය නිර්මාණ පැදුරෙහි ප්‍රදර්ශනය කරයි. සිසුන් සඳුදා දින එය කියවයි. අවබෝධ කර ගනියි. එහි ඇති උපමා උපමේය පිළිබඳ සාකච්ඡා කරයි. පසු දින අඟහරුවාදා සිසුහු රචනයක් ලියති. ඒ සඳහා පෙර දින ගුරුතුමිය ලියූ රචනයෙහි තිබූ විවිධ අංග අහුලා ගැනීමට සිසුන් යොමු කරයි. එම රචනා මාතෘකාව ද එකකට එකක් ගැළපෙන සේ ලබා දීමට උත්සාහ ගනියි. උදාහරණ ලෙස ගුරුතුමිය "අසිරිමත් උදෑසන" යන මාතෘකාව යටතේ රචනය ලිව්වේ නම් සිසුන්ට "හිරු බැස යන සැන්දෑව" යන මාතෘකාව ලබා දේ. එවිට ගුරුතුමිය ලියූ රචනයෙන් යම් යම් දේ ගැනීමට සිසුන්ට හැකියාව ලැබේ.

මෙසේ සතියකට රචනා දෙක බැගින් ආදර්ශ රචනා ඉදිරිපත් කිරීමටත් එයට සමගාමී ව සිසුන් රචනා ලිවීමටත් යොමු කිරීමක් සිදු කෙරිණි. මේ ආකාරයට මාස තුනක් පමණ ගත වන විට දරුවන්ගේ නිර්මාණාත්මක බව විදහා දැක්වෙන්නට විය. ලිවීමේ රුචිය සිසුන් තුළ ඇති විය. ගුරුතුමිය සමඟ හරි හරියට ලිවීමට සිසුන් පෙලඹුණි. දෙවන පාසල් වාරය වන විට මාතෘකාවක් ලද විගස ඉතා ඉක්මනින් අලංකාර රචනයක් ලිවීමට එම සිසුහු සමත් වූහ.

ඒ නිසා ම දෙවන පාසල් වාරය වන විට ගුරු මහත්මියගේ ගැටලුව විසඳී ඉතා සතුටින් පන්ති කාමරයෙහි කටයුතු කිරීමට ඇය යොමු වූවා ය.

මින් මා ලද අත්දැකීම වූයේ නිර්මාණාත්මක ලිවීම යන්න සිසුන් සෑම දෙනා තුළ ම එක ලෙස නොපිහිටන දෙයක් බවත් ඒ සඳහා අත්වැලක් සැපයීමෙන් සියල්ලක් ම යොමු කර ගැනීමේ හැකියාව ඇති බවත් ය. එසේ ම දරුවැන්ට ලියන්න අමාරුයි. නිර්මාණාත්මක හැකියාව නැහැ? යන මැසිවිලිවලට වඩා එයට අවශ්‍ය පෝෂණය ලබා දිය යුතු බවත් ය.

මෙය දෙවන, තෙවන ප්‍රධාන අවධිවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නිරත ගුරු මහත්ම මහත්මීන්ට අත්හදා බැලිය හැකි ඉක්මනින් ප්‍රතිඵල ලබා ගත හැකි ක්‍රියාවලියකි.

**ඩබ්ලිව්.ඩී.ජී.එම්.ටිකිරි සිරි කුමාරි**

*ප්‍රාථමික ගුරු උපදේශිකා*

*දෙහිඕවිට අධ්‍යාපන කලාපය*

*රුවන්වැල්ල අධ්‍යාපන කොට්ඨාසය*





## උදෑසනක අසිරිය

ගස්වැල්වල කොළ    දලුලයි
කුකුළු පැටව් කෑම    සොයයි
සතුන්ගේ ද හඬ    පතුරයි
උදෑසනක සිරි ගෙන    දෙයි

සතුන්ද තම වැඩ    අරඹයි
ඉර දෙවියන් එළිය    ගෙනෙයි
පුෂ්ප පිපී සුවඳ    හමයි
උදෑසනක සිරි ගෙන    දෙයි

පැණි බීමට සමනලු    එයි
කුරුල්ලන්ගෙ හඬ    පතුරයි
මීදුම් පට අහස    වසයි
උදෑසනක සිරි    වැඩිවෙයි

කුරුලු ගීත නිතර    ඇසෙයි
සමනලුන්ගෙ සුවඳ    ගෙනෙයි
ළමයින්ගේ    ප්‍රමෝදයයි
උදෑසනක සිරිය    ගෙනෙයි

මදනළ ඇළ දොළ    පීරයි
සිසිල් සුළං ගත    පිනවයි
ඝණ්ඨා නාදය    හඬවයි
අලුයම සිත් පිබිදී    යයි

**ජ.එම්. දේශප්‍රිය**

*පස්වන ශ්‍රේණිය*

*බප/හෝ/ජනාධිපති විද්‍යාලය*

*හෝමාගම*




ඊ එම් දේශප්‍රිය - 5 ශ්‍රේණිය - ජනාධිපති විද්‍යාලය - හෝමාගම